# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,877/6 — 1969 ඔක්තෝබර් 31 වැනි සිකුරාද — 1969.10.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥපනත

(420 වැනි අධිකාරය වන) ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත් ආඥපනතේ 34 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම, මෙයින්,

(1) 1962 නොවැම්බර් 9 වැනි දින හා අංක 13,387 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1962 නොවැම්බර් 5 වැනි දින දරන ආඥවෙන් ලබා ගැනීමට විධානය කරන ලද අවුරුදු 5–7 ණය මුදල ලබා ගැනීම සඳහා ලංකාවේ දී නිකුත් කරන ලද ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු මේ ආඥපනතේ විධිවිධාන යටතේ නිකුත් කිරීමට ඇති වෙනත් ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු බවට පරිවර්තනය කළ යුතු ලෙස ප්‍රකාශ කරමි ; තවද

(2) (1) වැනි ඡේදයෙහි දක්වා ඇති ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු පරිවර්තනය කිරීම සඳහා මේ ආඥපනත යටතේ (මෙහි මින්මතු " අළුත් ව්‍යාපාර වස්තු " යනුවෙන් හඳුන්වනු ලබන) රු. 1,09,08,600ක ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු ඇති කිරීම සහ නිකුත් කිරීම සඳහා මීට අමුණා ඇති උපලේඛනයෙහි නිශ්චිතව දැක්වෙන නියමයන් හා කොන්දේසි අනුව බලය පවරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1969 ඔක්තෝබර් 31 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. අළුත් ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ලබා ගත යුතු මුදල රුපියල් එක් කෝටි නව ලක්ෂ අට දහස් හයසියයක් පමණකි. එය සම මිලට නිකුත් කරන අවුරුදු 5–7 ණය මුදලක් වශයෙන් ලබා ගත යුතුය.

2. ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු ඇති කර, නිකුත් කිරීමෙන් පමණක් ණය මුදල ලබා ගත යුතුය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 5ක් විය යුතුය.

4. ණය මුදල සඳහා අර්ධ වාර්ෂික පොළිය සෑම වර්ෂයකම මැයි පහළොස් වැනි දින සහ නොවැම්බර් පහළොස් වැනි දින ගෙවිය යුතුය.

5. ණය බේරීම සඳහා පිහිටුවන නිදන් අරමුදලට, වර්ෂයකට සියයට 5 මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම 1970 නොවැම්බර් පහළොස් වැනි ද ආරම්භ විය යුතුය.

6. අළුත් ව්‍යාපාර වස්තු නිදහස් කිරීමේ දිනය 1976 නොවැම්බර් පහළොස් වැනි දින විය යුතුය.

එසේ වුවද, 1974 නොවැම්බර් දහහතර වැනි දිනයට ඉක්බිති වූත්, හය මසකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි වූත්, යම් දිනයක, ඒ අළුත් ව්‍යාපාර වස්තු සම මිලට නිදහස් කිරීමේ කැමැත්ත රජයට තිබිය යුතුය.

### කාර්ය විස්තර පත්‍රිකාව

1969 නොවැම්බර් 15 වැනි දින හැරවෙනු සඳහා ව්‍යාපාර වස්තූන් හැරවීමේ ලැයිස්තුව 1969 නොවැම්බර් 11 වැනි දින විවෘත කොට 1969 නොවැම්බර් 14 වැනි දින වසා දමනු ලැබේ. ඉතිරි නොහැරවූ කොටසක් වේ නම් ඒ සඳහා මුදලින් ණය ලබා ගැනීමේ ලැයිස්තුව 1969 නොවැම්බර් 15 වැනි දින විවෘත කොට, එදිනම වසා දමනු ලැබේ.

### ලංකාණ්ඩුවේ හැරවීමේ ණය

#### ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල් 1,09,08,600—5%, 1974–76 ණය මුදල

ලංකාණ්ඩුව වෙනුවෙන් පහත දැක්වෙන ණය මුදල ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම ණය 1969 නොවැම්බර් 15 වැනිදට ආපසු ගෙවීමට නියමිත, සියයට 3½, 1967–69 "ආ" කාණ්ඩයේ ලංකාණ්ඩුවේ ණයපත් සම මිලට හරවා දීමෙන් හෝ ඉතිරි නොහැර වූ කොටසක් වේ නම්, ඒ සඳහා මුදලින් හෝ භාර ගනු ලැබේ.

1976 නොවැම්බර් 15 වැනි දින ආපසු ගෙවනු ලබන රුපියල් 1,09,08,600 සියයට 5 ණය—එහෙත් මෙම ණය 1974 නොවැම්බර් 14 වැනිදට පසුව හය මාසයක දැනුම් දීමකින් පසු ඕනෑම දිනයක ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ.

**ණය ලබාගැනීමේ බලය හා අරමුණ.**—(420 වැනි අධිකාරය වන) ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත් ආඥාපනතේ 34 වැනි වගන්තියේ විධිවිධාන යටතේ හා එම ආඥාපනතේ අඩංගු නීති යටතේ හා 1962 අංක 30 දරණ විසර්ජන පණතින් ලත් බලයෙන්, 1962 නොවැම්බර් මාසයේදී ලබාගත් රු. 1,66,12,100 සියයට 3¼, 1967–69 "ආ" කාණ්ඩයේ ණය මුදලින් කොටසක් හැරවීමෙන් මෙම ණය මුදල ලබාගනු ලැබේ.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය.)

**හැරවීම පිණිස ඉල්ලීම.**—1967–69 "ආ" කාණ්ඩයේ සියයට 3¼ ණයපත් හිමියන් විසින් තමන් සතු ණයපත් මුළුමණින්ම හෝ කොටසක් හෝ 1969 නොවැම්බර් 15 වැනි දිනයෙහි දී හැරවෙනු පිණිස 1974–76 සියයට 5 නව ණය මුදලට සමාන නාමික ප්‍රමාණයකට ඉදිරිපත් කළ හැකිය. මෙසේ හැරවීමට කෙරෙන ඉල්ලීම් 1969 නොවැම්බර් 14 වැනිද දක්වා ඉදිරිපත් කළ හැකිය. මේ ඉල්ලීම් ඊට නියමිත පෝරමය සම්පූර්ණ කොට නියමිත ව්‍යාපාර වස්තු සහතික ද සමග නොපමාව ඉදිරිපත් කළ යුතුය. අලුත් ව්‍යාපාර වස්තු සඳහා සම්පූර්ණ අර්ධ වාර්ෂික පොළිය 1970 මැයි 15 වැනි දින ගෙවනු ලැබේ.

**මුදලින් ගෙවීමේ ඉල්ලුම් පත්.**—ව්‍යාපාර වස්තු හරවා දීමෙන් පසු 1967–69 "ආ" කාණ්ඩයේ සියයට 3¼ ණය මුදලේ රු. 1,09,08,600න් ඉතිරි නොහැර වූ කොටසක් වේ නම් ඒ සඳහා මුදලින් ගෙවීමේ ඉල්ලුම් පත් 1969 නොවැම්බර් 15 වැනි දින භාර ගනු ලැබේ. මුදලින් ගෙවීම සඳහා කෙරෙන ඉල්ලුම් පත් ඒ සඳහා නියමිත පෝර්ම සම්පූර්ණ කොට මුළු මුදල සමඟ එවිය යුතුය. ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ සහ තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කොට ඇති අයට මේ බැංකු මාර්ගයෙන් සිය ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය. " ලංකාණ්ඩුවේ ණය අරමුදල " යනුවෙන් හරස් රේඛීත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණකරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය. ප්‍රථම පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1970 මැයි 14 වැනි ද දක්වා වූ කාල සීමාව සඳහාය. ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල් ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**තැරැව් ගාස්තු.**—බැංකුවලට ද (ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුව ඇතුළු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ට ද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම්පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16 ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාර ගත් ණය මුදලේ නාමික මිල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු කොටස් සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව මැයි 15 වැනි ද හා නොවැම්බර් 15 වැනි ද වර්ෂයකට සියයට 5 බැගින් පොළී ගෙවනු ලැබේ.

**අයබදු ගැනීම.**—(i) මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදායම් බදු :—ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට හැර ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදායම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත්, ආදායම් බද්දට යටත් වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදායම් බදු සඳහා තමාගේ ආදායම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට හා ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට පොළී ගෙවීමට පෙර ආදායම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දැනට ආදායම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅜ක් ද, නිර්නේවාසික සමාගම් වලට ගෙවන ලද හෝ බැර කරන ලද පොළිය සම්බන්ධයෙන් සියයට 67ක් ද වෙයි.) ලංකා ආදායම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදායම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) බූදල් බද්ද :—ලංකාණ්ඩුව විසින් ලංකාව ඇතුළත නිකුත් කරන ලද ව්‍යාපාර වස්තු බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තුන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැකිය. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තුන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවෙන මුදලත් යන දෙකින් අඩු මුදල යමක් වේද, එයට නොඅඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තුන් මුලින් නිකුත් කරන අවස්ථාවේදී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තුන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂා වී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියේට 5 ප්‍රමාණය අනුව 1970 නොවැම්බර් 15 වැනි ද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දැනට ලංකාණ්ඩුවේ දළ සදතන ණය ප්‍රමාණය රු. 462,43,41,408කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදල්හි ආසන්න වෙළෙඳ වටිනාකම රු. 64,88,84,430කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 397,54,56,978කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය.

වැඩ බලන රාජ්‍ය ණය ලේඛකාධිකාරී තැන,

කොළඹ 1,
තැ. පෙ. 1149,
ශ්‍රී ලංකා මහ බැංකුව,
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
1969 ඔක්තෝබර් 31 වැනි දින දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.